**පිවිතුරු බලශක්ති හා ප්‍රවේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2013**

-----------------------------------------------------------------------

පිවිතුරු බලශක්ති හා ප්‍රවේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ආසියානු සංවර්ධන බැංකුව (ආ ස බැ) හා ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) සහ සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගම (ලෙකෝ) අතර 2009 ජුනි 17 දින එළඹි අංක 2518 සහ අංක 2519 එස්ආර්අයි (එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුම්වල 11 ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සහ අංක 0149 - එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය සහ ප්‍රදාන ගිවිසුම් අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතියේ සියලුම කොටස් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ලංකා විදුලි (පුද්ගලික) සමාගම ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ඒකාබද්ධව 3 සහ 4 යන කොටස් ක්‍රියාත්මක කරනු ලැබේ.

(i) වඩා ශක්තිමත් සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාලය සහ නාගරික වීදි ආලෝකකරණ ඉල්ලුම් පාර්ශව කළමනාකරණය

(ii) කුඩා ජල විදුලි පිරියත සඳහා ජාලගත බාධාවන් ඉවත්කිරීම් සහ

(iii) නැගෙනහිර පළාතේ වඩාත් ශක්තිමත් සම්ප්‍රේෂණ ජාලය සහ තෝරාගත් පළාත්වල සේවා සම්බන්ධතා සඳහා දීර්ඝ කරන ලද ණය ආධාර වැඩසටහන් මඟින් ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙහි ආවරණය සහ සේවා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම මඟින් දැරිය හැකි සහ විශ්වාසදායක විදුලි බලය සැපයීම තහවුරු කිරීම ව්‍යාපෘතියේ අරමුණුවේ.

2009 ජුනි මස ව්‍යාපෘති පරිපාලන ලියවිල්ල අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 20,274.8 කට සමාන එජඩො මිලියන 188.2 ක් වන අතර එයින් රු.මිලියන 17,689.2 කට සමාන එ ජ ඩො මිලියන 164.2 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 09 දින ආරම්භ කරන ලද අතර 2013 මැයි 31 දින වනවිට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් ණය අංක 2518 ට අදාළව කාලය 2013 නොවැම්බර් 30 දින සිට 2015 නොවැම්බර් 30 දක්වා සහ ණය අංක 2519 ට අදාළව කාලය 2013 නොවැම්බර් 30 සිට 2015 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. පසුව ප්‍රදානය නිමකිරීමේ දිනය 2014 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.මූල්‍ය ප්‍රභවයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ප්‍රභවය | කොටස් අංකය | එ ජ ඩො මිලියන | එ ජ ඩො මිලියන | ශ්‍රී ල රු මිලියන | ශ්‍රී ල රු මිලියන |
|---|---|---|---|---|---|
| ආ ස බැ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් (OCR) ණය- ලංවිම | 1,2,5,6 සහ 7 | 114.4 | | 12,324.3 | |
| ලෙකෝ | 3 | 20.6 | 135.0 | 2,219.2 | 14.543.5 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ආසියානු සංවර්ධන අරමුදල (ADF)ණය- | 7 | 21.5 | | 2316.1 | |
| ලංවිම | 8 | 3.5 | 25.0 | 377.0 | 2693.1 |
| **ප්‍රදාන** | | | | | |
| ජපන් රජය * | 4 | 2.0 | | 215.6 | |
| කාලගුණය වෙනස්වීමේ අරමුදල | 4 | 2.2 | 4.2 | 237.0 | 452.6 |
| උප එකතුව | | | 164.2 | | 17,689.2 |
| ශ්‍රී ලංකා රජය (ශ්‍රී ලං ර) | | | 24.0 | | 2,585.6 |
| එකතුව | | | 188.2 | | 20,274.8 |

❖ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් පරිපාලනය කරනු ලබන පිවිතුරු බලශක්ති මූල්‍යයන හවුල්කාර පහසුකම යටතේ ආසියානු පිවිතුරු බලශක්ති අරමුදල මඟින් සපයා ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්,යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත.එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී.මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද

විගණනයට ඇතුළත් වේ.මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී.ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන,ගනුදෙනු,වත්කම්,වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියෙහි මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය හා ප්‍රදානයෙන් කරන ලද මිලදී ගැනීම්, හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය/ ප්‍රදාන ගිවිසුම් යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල නියම කරන ලද පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය/ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) ඉකුත් වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව හා

(ඌ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල සඳහන් මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

**3. මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම් වල නියම කර ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල සඳහන් කර තිබෙන මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.4,811,874,425 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 14,098,112,042 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| කාර්යයන් | වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| පද්ධති පාලන නවීකරණය | 880,758,061 | 715,542,953 | 1,672,788,808 |
| සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීම සම්ප්‍රේෂණ රේඛාව | 317,651,981 | 1,325,112,133 | 2,518,460,483 |
| සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීම ග්‍රිඩ් උපපොළ | 1,428,748,609 | 1,214,526,043 | 2,791,036,801 |
| පුනර්ජනනීය බලශක්ති සඳහා ජාලධාරිතා වර්ධනය | 570,794,312 | 2,205,259,942 | 3,143,516,437 |
| පද්ධති පාලන නවීකරණය සඳහා උපදේශක සේවා | 4,745,085 | 15,521,436 | 34,754,050 |
| නැගෙනහිර පළාතේ සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම | 522,482,319 | 1,609,026,203 | 2,510,352,208 |
| බෙදාහැරීම් උපපොළ වර්ධනයන් (ලෙකෝ) | 1,075,169,083 | 121,604,939 | 1,407,975,204 |
| මහනගර වීදි ආලෝකය සඳහා ඉල්ලුම් පැති කළමනාකරණය (ලෙකෝ) | --- | 4,220,665 | 6,039,333 |
| මහනගර වීදි ආලෝකය සඳහා ඉල්ලුම් පැති කළමනාකරණය (ලංවිම) | 11,863,289 | 4,780,176 | 17,761,689 |
| මුළු වියදම | 4,812,212,739 | 7,215,594,490 | 14,102,685,013 |
| අඩු කළා- වෙනත් ආදායම් සහ වාසි | (338,314) | (1,049,079) | (4,572,971) |
| මුළු ශුද්ධ වියදම | 4,811,874,425 | 7,214,545,411 | 14,098,112,042 |

## 5. විගණන නිරීක්ෂණ

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව ව්‍යාපෘතියේ විගණිත මූල්‍ය ප්‍රකාශන අදාළ මුදල් වර්ෂයෙන් අනතුරුව මාස 9 කට නොවැඩි කාලයක් තුළ ඒවා ලද වහාම ආසියානු සංවර්ධන බැංකුවට ඉදිරිපත් කළ යුතු වේ. ඉහත සඳහන් කාල පරාසය තුළ එකී අවශ්‍යතාවය ඉටුකිරීම සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සාධාරණ කාලයක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ව්‍යාපෘතියේ වගකීම වේ. කෙසේ වෙතත් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අගෝස්තු 08 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

## 5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ කොටස් 1 හා 5 යටතේ 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ප්‍රතිපූර්ණය කළයුතු විදේශාධාර රු.15,467,796 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් මිලදී ගෙන තිබූ මෝටර් රථ 57 න් 17 ක් 2013 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලයට මාරු කර තිබුණි. නමුත් ඒවායෙහි මාරුකිරීමේ පිරිවැය තහවුරු කරගෙන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව රු. 821,526,530 ක් සමාලෝචිත වර්ෂය සඳහා ණය ගැනීමේ පිරිවැය ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත් විගණනය විසින් කරන ලද ගණනය කිරීම අනුව ණයගැනීමේ පිරිවැය රු. 871,489,688 ක් විය.

(ඈ) ණයගැනීමේ පිරිවැය සඳහා කරන ලද සාවද්‍ය ගැලපීම් හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු ආයකය රු.121,577,672 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පෙන්වා තිබූ මූල්‍ය කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය,ඉහත කී සාවද්‍ය ප්‍රකාශ හේතුවෙන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

## 6 මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය

## 6.1 අරමුදල් උපයෝජනය

ව්‍යාපෘතියේ මූල්‍යයනය සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම් අනුව එකඟ වූ මුදල | | 2013 සඳහා අයවැය ප්‍රතිපාදන | 2013 වර්ෂය තුළදී උපයෝජිත අරමුදල් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| ආ ස බැ ණය | 164.2 | 17,689.2 | 4,784.6 | 3604.4 | 10,727.2 | 6,962.0 | 39 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ල ර/ලංවිම | 24.0 | 2,585.6 | 299.0 | 200.2 | 1283.0 | 1,302.6 | 50 |
| | --------- | ------------- | -------------- | ------------ | ------------ | ---------------- | |
| | 188.2 | 20,274.8 | 5,083.6 | 3804.6 | 12,010.2 | 8,264.6 | 41 |
| | ====== | ======== | ======== | ======== | ======== | ========= | |

2013 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් සියයට 69 ක් ගෙවී ඇතත්, 2013 දෙසැම්බර් 31 දිනවන විට විදේශිය අරමුදල්වල මූල්‍ය කාර්ය සාධනය සියයට 61 ක් වූයෙන් විදේශ අරමුදල් භාවිතය සහ ව්‍යාපෘති කාලය අතර ප්‍රමාණාත්මක අසමතුලිතතාවක් නිර්මාණය වී තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය සියයට 59 ක් පමණක් වී තිබුණි.

**6.2 භෞතික කාර්යසාධනය**

----------------------------

පහත විස්තර කර ඇති විවිධ හේතුන් නිසා 2013 දෙසැම්බර් 31 දිනට වැඩිදියුණු කිරිමේ වැඩ රාශියක් ආරම්භ කර නොතිබූ බව හෝ මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි.

(i) ආසියානු සංවර්ධන බැංකුවේ එකඟත්වය ලබාගැනීමේ ප්‍රමාදය හේතුවෙන් පැකේජය ‘A’ හි 1 කොටස යටතේ ජාතික පද්ධති පාලන සහ අධීක්ෂණ පාලන ස්ථාපිත කිරීම,දත්ත පවරාගැනීම සහ සන්නිවේදන පද්ධති ඉදිකිරීම හා සම්බන්ධ වැඩ ආරම්භ කර නොතිබුණි.

(ii) කුරුණෑගල දැනට පවතින ග්‍රිඩ් උපපොළ වර්ධනය කිරීමට අදාළ වැඩවල විෂය පථය පසුව වෙනස්කරන ලදී. එබැවින් එහි වැඩ ආරම්භ කරන ලද්දේ 2013 නොවැම්බර් 19 වැනි දින දීය.

(iii) ද්‍රව්‍ය ප්‍රසම්පාදනයේ ප්‍රමාදය හේතු කොටගෙන හොරණ සහ වේයන්ගොඩ දැනට පවතින ග්‍රිඩ් උපපොළ වල වර්ධනය කිරීම් මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි.

(iv) මූල්‍ය සේවා සැපයුම්කරුවකු තෝරාගැනිමේ ප්‍රමාදයන් හේතුකොට ගෙන ග්‍රාමීය ගෘහ සම්බන්ධනයන් ලබා දී නොතිබුණි.

**6.3 ව්‍යාපෘති නියාමනය**

--------------------------

ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන සියලුම විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති වල වගකීම දරන අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) ගේ විෂය පථයට මෙම ව්‍යාපෘතියේ කටයුතු ඇතුළත් නොවේ. එබැවින් කොටස් 8 ක් යටතේ වූ සියලු කාර්යයන් පිළිබඳ ආසන්න අධීක්ෂණය ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදු කර නොතිබුණි.

**6.4 මතභේදයට තුඩුදෙන කරුණු**

----------------------------------

ව්‍යාපෘතියේ ඉංජිනේරුවරුන්ට ප්‍රවාහන පහසුකම් සැපයීමට මෝටර් රථ මිලදී ගැනීම සඳහා ව්‍යාපෘති ලියකියවිලිවල ප්‍රතිපාදන සලසා නැති නමුත් ණය මුදල් ලැබීම් උපයෝගී කරගෙන එකී කාර්යය සඳහා මෝටර් වාහන 57 ක් කොන්ත්‍රාත්කරුවන් 4 දෙනෙකු විසින් මිලදී ගෙන තිබුණි. තවද එකී මෝටර් වාහන කොන්ත්‍රාත්කරුගේ නමින් ලියාපදිංචි කර තිබුණි.

**7** **පද්ධති හා පාලන**

**---------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ප්‍රතිපූර්ණය

(ඇ) කාර්යසාධන සමාලෝචනය